# මාධ්‍ය සටහන

# වාර්ෂික දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු

# 2010

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව.

**<u>පවත්නා මිල යටතේ සහ ස්ථාවර (2002) මිල යටතේ ඇස්තමේන්තු කරන ලද 2010 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) සහ ඒ ආශ්‍රිත ආර්ථික දර්ශක ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මෙයින් ප්‍රකාශයට පත් කෙරේ.</u>**

දළ දේශීය නිෂ්පාදිතය මඟින් මනිනු ලබන ශ්‍රී ලංකාවේ ආර්ථික නිමවුම ස්ථාවර (2002) මිල අනුව 2009 වර්ෂයේ රුපියල් බිලියන (රු.බි.) 2,449.2 ට සාපේක්ෂව 2010 දී රු.බි. 2,645.4ක් දක්වා ඉහළ යමින් 2009 දී වාර්තා කරන ලද සියයට 3.5ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව 2010 වසරේදී සියයට 8.0ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම සාධනීය ඉහළ වර්ධනය රටේ ආර්ථික සංවර්ධනයට වඩා වැදගත් වන අතර එය නිදහසින් පසු ළඟා කරගත් ද.දේ.නි.යේ දෙවැනි ඉහළම වර්ධනය විය. මෙරට ඉතිහාසයේ ද.දේ.නි.යේ ළඟා කර ගත් ඉහළම වර්ධනය සියයට 8.2ක් වූ අතර එය 1968 හා 1978 යන වසරවල ළඟා කර ගන්නා ලදී.

ආර්ථිකයේ ප්‍රධාන අංශ තුන වන කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා පිළිවෙලින් සියයට 7.0කින්, සියයට 8.4කින් හා සියයට 8.0කින් වර්ධනය විය. මෙයින් කර්මාන්ත හා සේවා අංශ පෙර නොවූ ආකාරයට වර්ධනය වෙමින් 2002 සිට මේ දක්වා ලැබූ ඉහළම වර්ධනය ළඟා කර ගෙන ඇත. 2010 වසරේ සාපේක්ෂ ඉහළ වර්ධනයක් පැවති උප අංශ හා ඒවායේ වර්ධනය සටහන් වන්නේ, “තේ සියයට 13.1ක් ” “රබර්” සියයට 12.7ක්, “සුළු අපනයන බෝග” සියයට 37.6ක්, “වී” සියයට 17.5ක්, “ධීවර” සියයට 12.2ක් “පතල් හා කැණීම්” සියයට 15.5ක්, “ඉදිකිරීම්” සියයට 9.3ක්, “විදුලිය, ගෑස් හා ජලය” සියයට 7.8ක්, “තොග හා සිල්ලර වෙළෙඳාම” සියයට 7.5ක්, හෝටල් හා ආපනශාලා සියයට 39.8ක්, “ප්‍රවාහනය හා සන්නිවේදනය” සියයට 11.9ක් හා “බැංකු රක්ෂණ හා නිශ්චල දේපොළ” සියයට 7.5ක් ලෙසය.

එසේ වුවද, 2009 වසරට සාපේක්ෂව 2010 වර්ෂයේ වර්ධනය සියයට (-)14.3ක් ලෙස සටහන් වෙමින් “පොල්” නිෂ්පාදන උප අංශයෙහි පසුබැසීමක් පෙන්නුම් කළේය. “සත්ත්ව නිෂ්පාදන”, “වෙනත් ආහාර බෝග” (ගොඩ ගොවිතැන් බෝග, එළවළු හා පලතුරු), “දැව සහ දර” හා “ගෑස්”, යන උප අංශ 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේදී අඩු වර්ධන වේගයක් වාර්තා කළේය. එම අංශ 2010 දී පිළිවෙලින් සියයට 2.9කින්, සියයට 4.4කින්, සියයට 3.1කින් හා සියයට 4.6කින් වර්ධනය වී තිබුණි.

කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශ ස්ථාවර (2002) මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයට කළ ප්‍රතිශත දායකත්වය 2010 වර්ෂයේදී සියයට 11.9ක්, 28.8ක් හා 59.3ක් ලෙස පැවතිණි.

කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙන් මනිනු ලබන වාර්ෂික උද්ධමන අනුපාතය 2010 දී සියයට 5.9ක් විය. 2009 දී එය සියයට 3.4ක් ලෙස සටහන් විය. ආර්ථිකයේ සමස්ත මිල මට්ටමේ විචලනය නිරූපනය කෙරෙන දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය (2002=100), 2009 දී පැවති දර්ශකාංක 197.4 සිට 2010 දී දර්ශකාංක 211.8 දක්වා ඉහළ යමින් උද්ධමන අනුපාතය 7.3ක් ලෙස සටහන් කළේය.

පවත්නා වෙළෙඳපොළ මිල අනුව, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (*දළ දේශීය නිෂ්පාදිතය පදනම් කරගත් ඒක පුද්ගල ආදායම*) 2009 දී පැවති රුපියල් 236,445 [එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.) 2,057] සිට 2010 දී රුපියල් 271,259 (එ.ජ.ඩො. 2,399)ක් දක්වා ඉහළ යමින් 2009 වසරට සාපේක්ෂව රුපියල් වටිනාකම අනුව සියයට 14.7ක ද එ.ජ.ඩො. වටිනාකම අනුව සියයට 16.6ක ද වර්ධනයක් පෙන්විය.

පවත්නා වෙළෙඳපොළ මිල අනුව, පෞද්ගලික අවසාන පරිභෝජන වියදම 2009 වර්ෂයේ රු.බි. 3,116.2ක් ද 2010 වර්ෂයේදී රු.බි. 3,684.7ක් ද විය. පවත්නා වෙළෙඳපොළ මිල අනුව, දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 2009 වර්ෂයේදී රු.බි. 1,147.4ක් ද 2010 වර්ෂයේ රු.බි. 1,452.0ක් ද ලෙස ඇස්තමේන්තු කර ඇත. දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2009 හා 2010 වර්ෂවල පිළිවෙලින් සියයට 23.7ක් හා 25.9ක් ලෙස පැවතිණි.

පවත්නා වෙළෙඳපොළ මිල අනුව, දළ ඉතුරුම් 2009 වර්ෂයේ රු.බි. 1,141.5ක් ද 2010 වර්ෂයේ රු.බි. 1,360.1ක් ද විය. ඒ අනුව, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස දළ ඉතුරුම් 2009 හා 2010 වර්ෂවල පිළිවෙලින් සියයට 23.6ක් හා 24.3ක් විය.

## කෘෂිකර්මාන්ත අංශය

කෘෂිකර්මාන්ත, වන හා ධීවර අංශය 2010 වර්ෂයේදී සියයට 7.0කින් වර්ධනය විය. පසුගිය වර්ෂයේ කෘෂිකර්මාන්ත අංශයේ වර්ධනය සියයට 3.2ක් විය.

2010 වර්ෂයේ තේ නිෂ්පාදනය එකතු කළ අගය සියයට 13.1කින් වර්ධනය විය. 2009 වර්ෂයේ මෙම අංශයේ සියයට 8.4ක සෘන වර්ධනයක් පැවතිණි. පහත වැටුණු තේ නිෂ්පාදනය යථාතත්ත්වයට පත් වෙමින් ඉහළ යාම හා 2010 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පැවති හිතකර කාලගුණය 2010 තේ නිෂ්පාදනයේ ඉහළයාමට හේතු විය. එසේ වුවද, 2010 සිව්වැනි කාර්තුවේ පැවති අයහපත් කාලගුණය හේතුවෙන් එම කාර්තුවේ තේ නිෂ්පාදනයෙහි සියයට 1.0ක පසුබැසීමක් වාර්තා විය.

රබර් නිෂ්පාදිතය එකතු කළ අගය 2010 වර්ෂයේදී සියයට 12.7කින් වර්ධනය විය. පෙර වර්ෂයේ මෙම අංශයේ වර්ධනය සියයට 7.9ක් විය. කොළඹ වෙන්දේසියේ රබර් කිලෝ එකක සාමාන්‍ය මිල 2009 දී පැවති රු. 201.66 සිට 2010 දී රු. 397.70 දක්වා සියයට 97.2කින් ඉහළ ගියේය. මිල ඉහළ යාමෙන් රබර් වගාවෙහි නඩත්තු කටයුතුවල හා කිරි කැපීමේ ඇති වූ ප්‍රගතිය මෙම වර්ධනයට හේතුවිය.

2010 වර්ෂයේ පොල් නිෂ්පාදනය එකතු කළ අගයෙහි සියයට 14.3ක පසුබැසීමක් පෙන්නුම් කළ ද පසුගිය වසරේ සියයට 5.3ක වර්ධනයක් පැවතිණි. 2010 වර්ෂයේ මෙවැනි පසුබැසීමක් ඇතිවීමට, 2009 වසරේ පැවති අඩු වර්ෂාපතනය, පළිබෝධ හා රෝග හානි ඇතිවීම හා පොල් වගා කරන ප්‍රධාන ප්‍රදේශවල පැවති අඩු ආර්ද්‍රතාව මූලික ලෙස හේතු විය.

2010 වර්ෂයේ සුළු අපනයන බෝග නිෂ්පාදනය එකතු කළ අගය සියයට 37.6ක වර්ධනය වූ අතර අතර පසුගිය වසරේ සියයට 5.2ක වර්ධනයක් පැවතිණි. 2010 වර්ෂයේ කරාබු නැටි, තල ඇට හා කජු අපනයන ප්‍රමාණය පිළිවෙලින් සියයට 206.6කින්, සියයට 438.8කින් හා සියයට 94.7කින් ඉහළ ගියේය.

2010 වර්ෂයේ සියයට 17.5කින් වර්ධනය වූ වී නිෂ්පාදනය එකතු කළ අගයෙහි 2009 වර්ෂයේ පැවතියේ සියයට 5.1ක පසු බැසීමකි. 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ වී වගා කළ බිම් ප්‍රමාණය සියයට 9.0කින් හා අස්වැන්න නෙලාගත් බිම් ප්‍රමාණය සියයට 12.5කින් වැඩිවී ඇත. ඉහළ වී මිල, 2010 වර්ෂයේදී වී වගාවට අවශ්‍ය ජල සැපයුම මැනවින් පවත්වාගෙන යාමට හැකි වීම, යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල වසර ගණනක් වගා කිරීමට නොහැකි ව පැවති කුඹුරු නැවත වගා කිරීම, පොහොර සහනාධාරය හා වී සහතික මිල ආදී කෘෂිකර්මයට හිතකර රජයේ ප්‍රතිපත්ති වී නිෂ්පාදනය වැඩි වීමට බලපෑ ප්‍රධාන සාධක විය.

සත්ත්ව නිෂ්පාදන උප අංශය 2010 දී සියයට 2.9කින් වර්ධනය විය. රටපුරා ගොඩනැගුණු සාමකාමී වාතාවරණය සත්ත්ව නිෂ්පාදනයේ වර්ධනයට හේතු වූ අතර, විශේෂයෙන්, උතුරු හා උතුරු මැද පළාත්වල සත්ත්ව නිෂ්පාදනය වැඩිවීම මෙම අංශයේ වර්ධනයට හේතු විය.

2010 වර්ෂයේ සමස්ත ධීවර නිෂ්පාදනය එකතු කළ අගය සියයට 12.2කින් වර්ධනය විය. ඒ තුළ මිරිදිය ධීවර නිෂ්පාදනය සියයට 10.1කින් ද කරදිය ධීවර නිෂ්පාදනය සියයට 12.5කින් ද වර්ධනය විය. මතස්‍ය පැටවු ජලාශ වෙත මුදාහැරීම, උතුරේ දැනට ක්‍රියාත්මක වන මිරිදිය ධීවර සංවර්ධන වැඩටහන්, මිරිදිය කර්මාන්තයේ යහපත් කළමනාකරණය, මන්නාරම හා වවුනියාව දිස්ත්‍රික්කවල මිරිදිය ධීවර කර්මාන්තය යලි ඇරඹීම මිරිදිය ධීවර කර්මාන්තයේ පැවති ඉහළ වර්ධනයට උපකාර විය. උතුරේ මසුන් මැරීමේ කාලය හා මසුන් මැරීමේ ප්‍රදේශ සම්බන්ධව පනවා තිබුණු සීමා ඉවත් කිරීම, උතුරු හා නැගෙනහිර පළාත්වල මතස්‍ය නිෂ්පාදනය වැඩිවීම සහ ධීවර කර්මාන්තය හා සම්බන්ධ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම කරදිය ධීවර කර්මාන්තයේ පැවති ඉහළ වර්ධනයට හේතු විය.

## කර්මාන්ත අංශය

මූර්ත වටිනාකම අනුව, 2010 වර්ෂයේ කර්මාන්ත අංශය එකතු කළ අගය සියයට 8.4කින් වර්ධනය විය. 2009 දී මෙම අංශය සියයට 4.2කින් වර්ධනය වී තිබුණි. කර්මාන්ත අංශයට ප්‍රධාන දායකත්වය සපයන නිෂ්පාදන කර්මාන්ත උප අංශය 2010 වසරේදී සියයට 7.3කින් වර්ධනය විය.

මැණික් පතල් කර්මාන්තය 2010 දී සියයට 7.9කින් වර්ධනය විය. අදාල කාලය තුළ වටිනා ගල් වර්ග හා අර්ධ වටිනා ගල් වර්ග අපනයන ප්‍රමාණය සියයට 4.7කින් වැඩි විය.

නිෂ්පාදන කර්මාන්ත ශාලා උප අංශය සියයට 7.5කින් වර්ධනය විය. “රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන”, “ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන” සහ “යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදනය” පිළිවෙලින් සියයට 12.2කින්, සියයට 10.4කින් හා සියයට 8.2කින්, ද “රෙදිපිළි, ඇඟලුම් හා සම්භාණ්ඩ නිෂ්පාදන” සියයට 5.2කින් වර්ධනයවීම කර්මාන්ත නිෂ්පාදන අංශයේ ඉහළ වර්ධනයට හේතු විය.

2009 වසරේ සියයට 3.7කින් වර්ධනය වූ "විදුලිය, ගෑස් හා ජලය" උප අංශය 2010 දී සියයට 7.8කින් වර්ධනය විය. සමස්ත විදුලිබල ජනනය සියයට 8.4කින් ඉහළ ගියේය. ජල විදුලිබල ජනනය සියයට 46.4කින් වැඩි වූ අතර තාප විදුලිබල ජනනය සියයට 16.4කින් අඩු විය.

මූර්ත වටිනාකම අනුව, 2009 වසරේ සියයට 5.6කින් වර්ධනය වූ ඉදිකිරීම් උප අංශය 2010 වසරේ දී සියයට 9.3ක ඉහළ වර්ධනයක් පෙන්විය. මෙම වර්ධනයට නව සංවර්ධන ව්‍යාපෘති ඇරඹීම, ක්‍රියාත්මක වෙමින් පවතින මහ පරිමාණ සංවර්ධන ව්‍යාපෘති මෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක කළ නැවත පදිංචි කිරීමේ හා පුනරුත්තාපන වැඩසටහන් හේතු වී ඇත.

මෙම වර්ෂය තුළ මුළු සිමෙන්ති ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,212,865 සිට මෙට්‍රික් ටොන් 3,749,005 දක්වා සියයට 16.7 කින් වැඩි විය.

2010 වසර අවසානය වන විට නිවාස, ගොඩනැගිලි, ව්‍යාපාර ස්ථාන ආදිය ඉදිකිරීමට හා දේපොළ සංවර්ධනයට දෙන ලද ණය ප්‍රමාණය සියයට 39.6කින් වැඩිවිය.

**සේවා අංශය**

2002 වර්ෂයේ සිට මෙතෙක් වාර්තා වූ ඉහළම වාර්ෂික වර්ධනය සටහන් කරමින් 2010 වර්ෂයේ සේවා අංශය සියයට 8.0කින් වර්ධනය විය. පෙර වර්ෂයේ මෙම අංශයේ වර්ධනය සියයට 3.3ක් ලෙස පැවතුණි. මෙම ඉහළ වර්ධනයට සේවා අංශයේ උප අංශ වන "හෝටල් හා ආපන ශාලා" සියයට 39.8ක්, "ප්‍රවාහන හා සන්නිවේදන" සියයට 11.9ක්, "බැංකු රක්ෂණ හා නිශ්චල දේපොළ" සියයට 7.5ක් සහ "තොග හා සිල්ලර වෙළෙඳාම" සියයට 7.5ක් ලෙස වර්ධනය වෙමින් දායක විය.

අපනයන වෙළෙඳාම් අංශය 2010 වර්ෂයේදී සියයට 3.4කින් වර්ධනය විය. ශ්‍රී ලංකා මහ බැංකු ගෙවුම් ශේෂ ලේඛනය අනුව 2009 වර්ෂයේ පැවති රු.මි. 813,911ක් වූ අපනයන ආදායම 2010 වර්ෂය තුළ රු.මි. 937,737 දක්වා ඉහළ යමින් සියයට 15.2ක වැඩිවීමක් වාර්තා කළේය. අපනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය පිළිවෙලින් සියයට 3.7කින් හා 11.1කින් ඉහළ ගියේය.

ආනයන වෙළඳාම් අංශය 2010 වර්ෂයේදී සියයට 9.5කින් ඉහළ ගිය අතර පසුගිය වර්ෂයේ එහි වර්ධනය සියයට (-) 8.2ක් විය. 2009 පැවති මුළු ආනයන වියදම රු.මි. 1,172,618 සිට 2010 දී රු.මි. 1,528,171 දක්වා සියයට 30.3කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළෙඳ දර්ශක අනුව ආනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය පිළිවෙලින් සියයට 11.6කින් හා 16.7කින් ඉහළ ගියේය.

2010 වර්ෂයේ දී දේශීය වෙළඳාම් අංශය සියයට 7.6කින් වර්ධනය විය. මෙම ඉහළ වර්ධනයට දේශීය වෙළඳපොළට යොමු වූ කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනවල වැඩිවීම හේතු විය. දේශීයව බහුල ලෙස පරිභෝජනය කෙරෙන වී සහ මාළු නිෂ්පාදනවල ඉහළ යාම එම වැඩිවීමෙහි ගාමක බලවේගය විය.

2009 වසරේදී සියයට 13.3ක වර්ධනයක් පෙන් වූ හෝටල් සහ ආපන ශාලා උප අංශය මෙම වසරේදී සියයට 39.8ක ඉහළ වර්ධනයක් වාර්තා කළේය. 2009 දී 447,890ක් වූ සංචාරකයින්ගේ පැමිණීම 2010 දී 654,476 දක්වා සියයට 46.1කින් ඉහළ ගියේය. 2010 පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 1969 සිට මේ දක්වා වාර්තා වූ වැඩිම සංචාරක පැමිණීම වන අතර එම කාලය තුළ වාර්තා වූ දෙවැනි ඉහළම වැඩිවීමේ වේගයද විය. මෙම තත්ත්වයට රට පුරා ස්ථාපිත වූ සාමකාමී වාතාවරණය ප්‍රධාන හේතුව විය. 2010 දී සංචාරක ඉපයීම් සියයට 62.0කින් ඉහළ ගිය අතර, 2009 පැවති 48.4ක් වූ කාමර ධාරිතා උපයෝජන අනුපාතය 2010 දී 70.1 දක්වා ඉහළ ගියේය.

ප්‍රවාහන හා සන්නිවේදන අංශය මෙම වසරේදී සියයට 11.9ක වර්ධනයක් පෙන්නුම් කළේය. 2009 වසරේදී එහි වර්ධනය සියයට 6.3කි. මගී හා භාණ්ඩ ප්‍රවාහන උප අංශය සියයට 11.4කින්, භාණ්ඩ මෙහෙයුම් උප අංශය සියයට 16.8කින් හා තැපැල් හා විදුලි සංදේශ උප අංශය සියයට 13.2කින් වර්ධනය වීම මෙම අංශයේ ඉහළ වර්ධනයට හේතු විය.

2009 වසරේ සියයට 23.0ක අඩු වීමක් වාර්තා වූ වාහන නව ලියාපදිංචිය මෙම වසරේදී සියයට 76.0කින් වැඩිවිය. ඒ තුළ බස් රථ සියයට 237.1කින්, ත්‍රිරෝද රථ සියයට 129.2කින් හා භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගැනෙන වාහන සියයට 40.1කින් වැඩි වී ඇත. මෙයට 2010 ජූනි මස සිට වාහන ආනයන බදු අඩු කිරීම හේතු විය.

2010 දී ශ්‍රී ලංකන් ගුවන් සේවයේ මගී ආදායම හා පියාසර දුර (මගී කිලෝ මීටර්) පිළිවෙලින් සියයට 25.3කින් හා සියයට 19.7කින් වැඩිවී ඇත.

මෙම වසර තුළ මුළු දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව සියයට 17.6කින් වැඩි විය. මෙයට, ත්‍රස්තවාදයෙන් මුදාගත් උතුරු පළාත තුළ දුරකථන සේවාවේ සිදු වූ ව්‍යාප්තියත් පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගත හැකි නවීන උසස් තාක්‍ෂණය සහිත දුරකථන සේවා සැපයීමත් හේතු විය.

2010 වර්ෂයේදී බැංකු රක්‍ෂණ හා නිශ්චල දේපොළ උප අංශය සියයට 7.5කින් වර්ධනය විය. පෙර වර්ෂයේ එහි වර්ධනය සියයට 5.7ක් විය. 2010 වර්ෂයේදී ණය සහ අත්තිකාරම් පෙර වර්ෂයට සාපේක්‍ෂව ඉහළ වැඩිවීමක් වාර්තා කරන ලදී.

**ජාතික ගිණුම් අංශය,**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.**

**දුරකථනː- 094-011-2687108, 094-011-2676345, ෆැක්ස්ː–094-011-2676572,**

**ඊ-මේල්ː–national.accounts@statistics.gov.lk,**

**අන්තර්ජාලය www.statistics.gov.lk**